SJSD 2022 2 (1): 25-38

**SRI LANKA JOURNAL OF SOCIAL DEVELEPEMENT** (SJSD)
**Volume 02 – Issue 01**

DOI: https://doi.org/10.4038/sljsd.v2i1.13

# ශ්‍රී ලංකාවේ රැකියා විරැකියා අනුපාත කෙරෙහි අධ්‍යාපන මට්ටම්වල බලපෑම පිළිබඳ විවේචනාත්මක අධ්‍යයනයක්

# A Critical Study on the Impact of Educational Levels on Employment Unemployment Rates in Sri Lanka

**Dinusha Malshani H. G,[1]**
**Lecturer, Eurasian International Institute of Higher Education**,

## Abstract

Education is not only an essential concept for the successful existence of the younger generation and a virtuous society, but it also serves as a contributing factor in producing highly privileged citizens. Education is defined as a systematic process that enhances an individual's knowledge, skills, and attitudes (Gunasekara, 2011). As a country progresses towards developmental goals, education becomes a powerful determinant. Through the development of intelligence, personality, skills, and awareness within individuals, achieving a country's developmental goals becomes more attainable.

Although the policy of "education for all" exists, the level of education one attains is influenced by factors such as individual abilities, preferences, income level, family, and social conditions. Educational levels can be categorized as formal, informal, and non-formal. The labor force in the country represents these diverse educational levels. The primary aim of this study is to examine the extent to which educational levels contribute to minimizing unemployment rates.

For this purpose, Matara District, which has a high unemployment rate, was selected as the study area. The sample included individuals from the University of Ruhuna, a technical college, two major schools, and self-employed representatives from Grama Niladhari divisions within the

Malimbada Divisional Secretariat Division. Data was collected through a questionnaire distributed among the sample.

In the statistical analysis, descriptive statistics, correlation coefficients, regression analysis, and chi-square testing methods were used. When examining the impact of employment on individuals with no education, a strong positive correlation was observed. The analysis revealed that unemployment was higher among individuals with higher educational levels. This led to the conclusion that formal education should be tailored to match the needs of the labor market.

Factors such as the school attended and the socio-economic status of the family also appear to influence employment opportunities. It is suggested that bridging the gap between education and employment requires transforming knowledge-based education into more practical, applicable forms. Thus, an individual's educational level can have a direct impact on either unemployment or employment.

The labor force is a determining factor in a country's economic growth and developmental progress. When considering Sri Lanka's labor force, the percentage of the population that is unemployed is significantly high. Within the unemployment context of Sri Lanka, factors such as educational level, age, and gender contribute to noticeable variations. Various definitions have been put forward concerning structurally diverse unemployment conditions. To reduce unemployment, different strategic methods must be implemented within the economy. If educational levels can be aligned with labor market demands, Sri Lanka can potentially achieve rapid economic growth and development.

**Keywords: Educational level, unemployment, labor market, labor supply**

## හැඳින්වීම

අධ්‍යයන සත්වයකු වූ මිනිසාට සිය ජීවිතය පුරාම යම්යම් අවස්ථාවන්හීදී විවිධ දේ පිළිබඳව ඉගෙනීමට අවස්ථාව සැලසේ අධ්‍යාපනය යන්නට නිර්වචනයන් ඉදිරිපත් වී ඇත්තේ ඉගෙනීම, ඉගැන්වීම, රසවිඳීම, පුහුණුව ආදී විවිධ දේ ඊට අයත් වන බැවිණි. ඉගෙනීම යනු " පුද්ගලයා තුළ දැනුම, කුසලතා, ආකල්ප, වර්ධනය කරන ක්‍රියාවලියකි" එසේම අධ්‍යාපනය යනු "මිනිසාගේ කායික, මානසික, සාමාජීය, සංස්කෘතික, සදාචාරාත්මක, අධ්‍යාත්මික වශයෙන් සහජ ශක්තීන් නොනවත්වා වර්ධනය කරන්නා වූ නිත්‍ය ක්‍රියාවලියකි" (ගුණසේකර-2011) ශ්‍රී ලංකාවේ වයස අවුඃ 14 ට අඩු සියල්ලන්ට අධ්‍යාපනය ලැබීම අනිවාර්‍යය සාධකයක් ලෙස සලකනු ලබන (කාරියවසම්-1999) නමුත් පුද්ගලයාගේ අධ්‍යාපන මට්ටම තීරණය වීමට විවිධ හේතු සාධක බලපායි. මෙලෙස විවිධ අධ්‍යාපන මට්ටම් වලට හිමිකම් කියන පුද්ගලයන්ගේ ජීවන වෘත්තිය තීරණය කිරීමට අධ්‍යපන මට්ටම ප්‍රබල සාධකයක් වේ. ශ්‍රම වෙළඳපොල තුළ ශ්‍රම ඉල්ලුම හා සැපයුම අනුව සේවා වියුක්තිය තීරණය වේ. ශ්‍රම ඉල්ලුම් සාධක වලට ශ්‍රම සැපයුමේසාධකයක් වන පුද්ගලයා සතු අධ්‍යාපන මට්ටම් නොගැලපීම හා පුද්ගල රුචිකත්වය හේතුකොටගෙන සේවා වියුක්ත ජනගහනයක් බිහි වේ. (හේරත්. 1999) ශ්‍රම වෙළඳපොළ තුළ සේවා වියුක්ති අනුපාතය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී අධ්‍යාපන මට්ටම අඩු පුද්ගලයන් අතර විරැකියා මට්ටම අඩු අගයක් ද ඉහල අධ්‍යාපන මට්ටමක් සහිත පුද්ගලයන් අතර ඉහල සේවා වියුක්ති අනුපාතයක් ද හඳුනාගත හැකිය. විධිමත්, අවිධිමත් හා නොවිධිමත් යන අංශ වල අධ්‍යාපන ක්‍රමවේදයන් ශ්‍රම වෙළඳපොළ ශ්‍රම ඉල්ලුමට ගැලපුම් කළ හැකි නම් ඉහළ සේවා වියුක්ති අනුපාතයන් අවම කර ගත හැකිය.

## ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය හා එහි උපනතීන්

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ඉතිහාසය පිළිබඳව අවධානය යොමු කිරීමේදී ආගමික ස්ථාන කේන්ද්‍ර කොට ගත් අධ්‍යාපන ක්‍රමයක් හඳුනාගත හැකිය. නමුත් යටත් විජිත කාල වලදී ආගම පදනම් කරගත් අධ්‍යාපන ආයතන බිහි වූවත් සැමට සමාන අධ්‍යාපන අවස්ථා නොලැබිණ. 1940 දශකය පමණ වන විටමෙහි සමාජ විෂමතාව බිඳ දමමින් කන්නන්ගර මහා විද්‍යාල හරහා අධ්‍යාපනය නොමිල සේවාවක් බවට පත්විය. එමගින් සාක්ෂරතාවයේ ඉහලයාමට සාපේක්ෂව ශ්‍රම වෙළඳපොළ විවෘත නොවීම හරහා ප්‍රථම තරුණ කැරැල්ල 1970-80 කාලය තුළ ඇතිවිය. අධ්‍යාපන ක්‍රමය පුළුල් වූවද ශ්‍රම වෙළඳපොළ ඊට සරිලන අයුරින් වර්ධනය නොවීම එකී කැරැල්ලට හේතු සාධක විය. (ආරච්චි.2009)මෙලෙස විකාශනය වූ අධ්‍යාපන ක්‍රමය වර්ථමානය වන විට රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම අධ්‍යාපන ක්‍රමයන් හී ව්‍යුහය, පරිපාලනය ආදිය සැලකිල්ලට ගෙන කොටස් 3ක් යටතේ හඳුනා ගත හැකිය.

1. විධිමත් අධ්‍යාපනය

2. අවිධිමත් අධ්‍යාපනය


3. නොවිධිමත් අධ්‍යාපනය

## විධිමත් අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනය ලෙස අර්ථ දක්වා ඇත්තේ. පාසල්, පිරිවෙන්, විශ්ව විද්‍යාල වැනි විධිමත් ආයතන හරහා ලබා ගන්නා අධ්‍යාපනයයි. එනම් ප්‍රාථමික අධ්‍යාපනයේ සිට

උසස් අධ්‍යාපනය දක්වා වූ ක්‍රමවේදය වේ. අධ්‍යාපන පද්දතියේ අරමුණු අනුව ශාස්ත්‍රීය හා තාක්ෂණික ලෙස විධිමත් අධ්‍යාපනය දෙවැදෑරුම් වේ.

**රූපසටහන : 1**




**මූලාශ්‍රයඃ ගුණසේකර (2011)**

ඉහත වර්ගීකරණය ට අනුව වර්ථමානයේ බොහෝ ශිෂ්‍යයන් කනිෂ්ඨ ද්විතික මට්ටම හා ජේ්‍යෂ්ඨ ද්විතීක මට්ටමේ දී අධ්‍යාපනය අවසන් කරයි. මෙසේ පාසල, පිරිවෙන පදනම් කොට ගෙන ජේෂ්ඨ ද්විතික මට්ටම පසුකරන සුළු පිරිසක් උසස් අධ්‍යාපනයට යොමු වී ශ්‍රම වෙළඳපොළට ඇතුළත් වන අතර ඉතිරි කොටස සෘජුවම ශ්‍රම වෙළඳපොළට නිරාවරණය වේ.

මෙම උසස් අධ්‍යාපනයට යොමු නොවන තවත් කාණ්ඩයක් නොවිදිමත් අධ්‍යාපන ක්‍රමවේදය තම ඉදිරි ගමනට තෝරා ගනී. නමුත් එසේ නොවී ශ්‍රම වෙළඳපොළට ප්‍රවිෂ්ඨ වන පිරිස ඊට වඩා ඉහල අගයක් ගනී. රටේ විධිමත් අධ්‍යාපනය න්‍යායාත්මක ප්‍රවේශයක් ගැනීම තුළ වැඩ ලෝකයට මෙම ශ්‍රමය එලෙසින්ම ගැලපිය නොහැකි වී ඇත. (ගුණසේකර-2011)

### අවිධිමත් අධ්‍යාපනය

පුද්ගල හා සමාජ අත්දැකීම් පාදක කොට ගෙන විවිධ පරිසර පද්දති වලදී ලබා ගන්නා අසංවිධිත ක්‍රියාවලියකින් ලබන අධ්‍යාපනය අවිධිමත් අධ්‍යාපනය නම් වේ. අවිධිමත් අධ්‍යාපනයට කලින් නිම කලින් නියම කරගත් සූත්‍ර හෝ මාර්ගෝපදේශයන් නොමැත.

උදා÷ පුස්තකාල, ජනමාධ්‍ය, පරිසරය තුළින් ලබන අධ්‍යාපනය.

### නොවිධිමත් අධ්‍යාපනය

විධිමත් අධ්‍යාපන ක්‍රමයට අන්තර් ග්‍රහණය නොවූවන් හට ක්‍රමවත් දැනුම් සම්භාරයක් ප්‍රේෂණය කරන ක්‍රමවේදයකි. බොහෝ විට රැකියා ඉලක්ක කොට ගෙන මෙම අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කෙරේ. උදා÷ කොන්ඩා මෝස්තර පාඨමාලා, ඉලෙක්ට්‍රනික පාඨමාලා, වර්ථමානයේ නොවිදිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන NVQ තත්ත්වයන් යටතේ උසස් අධ්‍යාපන අවස්ථා ලබා ගත හැකිය.ශ්‍රී ලංකාවේ වැඩි අවදානයක් යොමුව පවතින්නේ විධිමත් අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳවයි. එය පාසල් අධ්‍යාපනයේ දී පහත අයුරින් වර්ගීකරණය කළ හැකිය.

### ශ්‍රම බලකාය

රැකියාවක් කිරීමට හැකියාව ඇති රැකියාවක් කිරීමට කැමති එනම් දැනටමත් රුකියාවක් කරමින් සිටින පුද්ගලයන් සහ රැකියාවක් අපේක්‍ෂාවෙන් සිටින පුද්ගලයන් ශ්‍රම බලකායට අයත් වේ. මෙම ශ්‍රම බලකායට අයත් පිරිස ආර්ථික වශයෙන් ක්‍රියාශීලී හා ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන වශයෙන් වර්ගීකරණය කළ හැකිය. **මූලාශ්‍රය : ශ්‍රම බල සමීක්‍ෂණ වාර්තාව.(2019)**

### ආර්ථික වශයෙන් ක්‍රියාශිලී නොවන ජනගහනය

පූර්ණ කාලීන අධ්‍යාපනය ලබන සිසුන්, ගෘහනියන්,සේවයෙන් විශ්‍රාම ගියපු පුද්ගලයින්, ආබාධිත පුද්ගලයින්ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවනජනගහනයට ඇතුළත් වේ.

**මූලාශ්‍රය : ශ්‍රම බල සමීක්‍ෂණ වාර්තාව.(2019)**

### ආර්ථික වශයෙන් ක්‍රියාශිලීජනගහනය

අදාළ සමීක්ෂණය සිදුවන කාලය තුළ රැකියා වියුක්ත හා රැකියා නියුක්ත මුළු ජනගහනය වෙයි.

### රැකියා නියුක්ත ජනගහනය

සමීක්ෂණ කාලය තුළ අවම වශයෙන් එක් පැයක්වත් ආර්ථික කටයුත්තක යෙදුන සේවකයන්, සේවායෝජකයන්, තමාගේ ආර්ථික කටයුත්තක යෙදෙන පවුලේ ආර්ථික කටයුත්තකට දායකවන්නන් වේ.

## රැකියා වියුක්ත ජනගහනය

සමීක්ෂණ කාලය තුළ රැකියාවක් නොකරන නමුත් රැකියාවක් සොයමින් සිටින ඉදිරි සති දෙක තුළ කිසියම් රැකියාවක් ලැබුනහොත් භාර ගැනීමට සූදානම් පුද්ගලයින් වෙයි.

## ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ගැටළුව

ආර්ථික ස්ථාවරත්වය පිළිබඳව සලකා බැලීමේ දී විරැකියා අනුපාතය ප්‍රබල සාධකයකි. ආර්ථික සංවර්ධන උපනතීන් විග්‍රහ කිරීමේදී ද විරැකියා අනුපාතයට ඉහළ බරතැබීමක් සිදු කරනු ලබයි. කාර්‍යක්ෂමතාව උපරිම වන හා සම්පත් ඵලදායීව භාවිතා වන ආර්ථිකයක විරැකියා අනුපාතය ශූන්‍ය අගයක් ගනී. එසේම විරැකියා අනුපාතය රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමට අවශ්‍ය දිශානතිය පෙන්නුම් කරන සාධකයකි. සංවර්ධිත රට වල අවම අනුපාතයක් පෙන්නුම් කරන විරැකියා අනුපාතය ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවල ඉහළ අගයක් නිරූපණය කරයි.(අතපත්තු. 2011) සේවා වියුක්තිය යන්නට විවිධ පුද්ගලයන් හා ආයතන විවිධ නිර්වචන ඉදිරිපත් කොට ඇත. අදල කාල පරිච්ඡේදය තුළ වැටුපකට, වේතනයකට, ලාභයකට හෝ පවුලේ අදයම වැඩි කිරීමට කිසියම් රැකියාවක් සොයමින් සිටින හෝ රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින එහෙත් රැකියාවක් නොමැති පුද්ගලයන් හා ගත වූ සතිය තුළ රැකියාවක් නොමැතිව සිටින අය හා රැකියාවක් සොයමින් සිටින අය හෝ රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටි අය මෙන්ම එවැනි පුද්ගලයන්ට එම සතිය තුළ රැකියාවක් කිරීමට හැකියාවන් ද තිබූ අය නම් එවැනි පුද්ගලයන් විරැකියා අනුපාතයට ගනන් ගනු ලැබේ. (ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව-2019)

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු නිර්වචනයට අනුව ගත වූ සතිය තුළ අඩුම වශයෙන් පැයක් වත් ශ්‍රමය සැපයීමට නොහැකි පුද්ගලයන් විරැකියාවෙන් යුතු පුද්ගලයන් ලෙස හැඳින් වේ. (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව-2019) ශ්‍රී ලංකාවේ රැකියාවක් කිරීමට කැමැත්තක් පැවතිය ද ඊට අවස්ථාවක් නොමැති අඉච්ඡානුගත සේවා වියුක්තියෙන් පසුවන තරුණ ශ්‍රමයක් දැකගත හැකිය. එසේම රැකියාවක් කිරීමට කැමැත්තක් නොමැති අඉච්ඡානුගත සේවා වියුක්තියෙන් පෙළෙන තරුණ ශ්‍රමයක් ද ආර්ථිකය තුළ හඳුනාගත හැකිය. වර්ෂයේ එක් එක් කාල වල දී ඇතිවන රැකියා අවස්ථා හේතුවෙන් සේවා වියුක්තියේ තවත් පැතිකඩක් පෙන්නුම් කරයි. වාරික සේවා වියුක්තිය ලෙස එය හඳුන් වනු ලබයි. එනම් විවිධ උත්සව, කෘෂි අංශය, සංචාරක අංශය යන අංශ හේතුවෙන් මෙම වාරික සේවා වියුක්තිය ඇති වේ. එසේම උගත් තරුණ පිරිස තමාට සුදුසු රැකියාවක් ලැබෙන තුරු තමා නියැලී සිටි රැකියාවෙන් ඉවත් වී වෙනත් රැකියාවකට යන කාලය තුළ ආර්ථිකයේ මැවෙන විරැකියා තත්ත්වය සාර්ෂක සේවා වියුක්තිය නම් වේ.(කාරියවසම්.1999) තාක්‍ෂණික ආගමනය නිසා ආර්ථිකය තුළ ව්‍යුහමය රැකියා වියුක්තියක් ඇති කරයි. උදහරණ ලෙස කෘෂි අංශයේ ගොයම් කැපීමට තාක්‍ෂණික උපකරණ භාවිතය තුළ ඇති වූ විරැකියා තත්ත්වය හඳුන්වා දිය හැකිය. මෙම විරැකියා තත්ත්වය දීර්ඝ කාලීනව ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑම් සිදු කරන සේවා වියුක්ති තත්ත්වයකි. ව්‍යාපාර චක්‍රයන් හි ඇතිවන දෝලනය හේතුවෙන් ඇතිවන සේවා වියුක්තිය චක්‍රීය සේවා වියුක්තිය නම් වේ. ශ්‍රී ලංකාවේ කෘෂි අංශය තුළ හා රාජ්‍යය ව්‍යවසාය වැනි අංශ වල යම් නිෂ්පාදන ක්‍රියාවලියක් ප්‍රශස්ථ අයුරින් ඉටු කිරීමට අවශ්‍ය ශ්‍රමයට වඩා වැඩි ශ්‍රමයක් ඊට යොදවා ගත් විට ඒ තුළ සැඟවුන සේවා වියුක්තියක් නිර්මාණය වේ. ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතය අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් සමග සැසඳීමේ දී පහළ අගයක් නිරූපණය කරයි. නමුත් ඉහළ අධ්‍යාපන මට්ටමක් සහිත තරුණ ප්‍රජාව තුළ සේවා වියුක්ති අනුපාතය ඉහල අගයක් ගනී. මෙම පිරිසෙන් බහුතරය වසරකට වඩා වැඩි කාලයක් සේවා වියුක්තව සිටීමට සිදුවේ.

## ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවා වියුක්තිය

ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන ශ්‍රම බල සමීක්ෂණ වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවා වියුක්තියේ ස්වභාවය පහත පරිදි දැක්විය හැකිය.

**වගු අංක : 01 ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවා වියුක්තිය 2010-2019**

| වසර | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| 2010 | 4.9 | 3.5 | 7.5 |
| 2011 | 4.0 | 2.7 | 6.3 |
| 2012 | 4.0 | 2.8 | 5.8 |
| 2013 | 4.4 | 3.2 | 6.2 |
| 2014 | 4.3 | 3.1 | 6.5 |
| 2015 | 4.7 | 3.0 | 7.6 |
| 2016 | 4.4 | 2.9 | 7.0 |
| 2017 | 4.2 | 2.9 | 6.5 |
| 2018 | 4.4 | 3.0 | 7.1 |
| 2019 | 4.8 | 3.3 | 7.4 |

**මූලාශ්‍රයඃ 2019 ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.**

2010 වර්ෂයට පෙර විරැකියා අනුපාතය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එම අගයන් ඉතා ඉහළ අගයන් ලෙස හඳුනාගත හැකිය. නමුත් 2010 වසරේ සිට සුළු උච්චාවචන තත්ත්වයන් පැවතියද සේවා වියුක්ති අනුපාතය අඩුවීමක් හඳුනාගත නොහැක. 2010, 2015, හා 2019 වසර වල දී විරැකියා අනුපාතිකය පෙර වසර වලට වඩා ඉහලයාමක් හඳුනාගත හැකිය පුමිතිරිභාවය අනුව සේවා වියුක්තිය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පුරුෂයන්ගේ විරැකියා අනුපාතයට වඩා ස්ත්‍රීන් ගේ විරැකියා අනුපාතය ඉහල යාමේ ප්‍රවනතාවක් හඳුනා ගත හැකිය.

## වයස් කාණ්ඩ අනුව ශ්‍රී ලංකාවේ විරැකියාව.

විරැකියාවේ ව්‍යුහමය ලක්ෂනයන්ට අනුව එහි ස්වභාවය අධ්‍යනය කිරීමේ දී විවිධ වයස් කාණ්ඩ වලදී විවිධ සේවා වියුක්ති අනුපාතිකයන් හඳුනා ගත හැකිය.

**වගු අංක : 02 ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතය වයස් කාණ්ඩ අනුව 2010 - 2019**

| වර්ෂය | වයස් කාණ්ඩ | | | |
|---|---|---|---|---|
| | **15-24%** | **25-29%** | **30-39%** | **40 ට වැඩි%** |
| 2010 | 19.4 | 9.2 | 3.1 | 1.0 |

| | | | | |
|---|---|---|---|---|
| 2011 | 17.2 | 7.6 | 2.7 | 0.7 |
| 2012 | 17.3 | 6.6 | 2.5 | 0.8 |
| 2013 | 19.1 | 7.5 | 2.7 | 1.0 |
| 2014 | 20.3 | 8.3 | 2.7 | 0.9 |
| 2015 | 20.8 | 9.4 | 3.1 | 1.0 |
| 2016 | 21.6 | 9.2 | 2.4 | 0.8 |
| 2017 | 18.5 | 9.5 | 2.7 | 0.9 |
| 2018 | 21.4 | 10.4 | 3.0 | 0.7 |
| 2019 | 21.5 | 11.0 | 3.1 | 1.2 |

**මූලාශ්‍රයඃශ්‍රම බල සමීක්ෂණ වාර්ථාව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2010-2019)**

වයස් ව්‍යුහය අනුව සේවා වියුක්තිය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඉහළ විරැකියා අනුපාතයක් පෙන්නුම් කරන්නේ 15-24 අතර වයස් කාණ්ඩය තුළයි. එනම් අධ්‍යාපන මට්ටමෙන් ඉවත් වන ශ්‍රම බලකාය අවශෝෂනය කර ගැනීමට ශ්‍රම වෙළඳපොළ තුළ හැඩ ගැසීමේ පවතින දුර්වලතාවයයි. ඒ තුළ තරුණ වයසේ ජනගහනයෙන් බහුතරය යම් කාලසීමාවක් විරැකියාවෙන් සිටී. අඩු විරැකියා අනුපාතයක් පෙන්නුම් කරනුයේ 40ට වැඩි වයස් කාණ්ඩය තුළයි.

### අධ්‍යාපන මට්ටම අනුව ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව

ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතයේ තවත් සුවිශේෂී ව්‍යුහමය ලක්ෂණයක් වන්නේ අධ්‍යාපන මට්ටම අනුව තරුණ විරැකියාවේ ස්වභාවයයි. එහි දත්ත පහත පරිදි දැක්විය හැකිය.

**වගු අංක : 03 අධ්‍යාපන මට්ටම අනුව ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව 2010-2019**

| වර්ෂය | 5 ශ්‍රේණිය සමත් හා ඉන් පහල % | 6 ශ්‍රේණිය සිට අ.පො.ස (සා.පෙළ) දක්වා % | අ.පො.ස (සා.පෙළ) සමත් % | අ.පො.ස (උ.පෙළ) |
|---|---|---|---|---|
| 2011 | - | 12.1 | 18.3 | 33.9 |
| 2012 | - | 12.2 | 20.5 | 30.6 |
| 2013 | - | 13.3 | 21.9 | 33.5 |
| 2014 | 10.4 | 14.8 | 22.8 | 31.3 |
| 2015 | 4.8 | 14.1 | 23.9 | 34 |
| 2016 | 6.5 | 16.3 | 22.4 | 32.5 |
| 2017 | 7.8 | 11.8 | 21.1 | 29.1 |

| | | | | |
|---|---|---|---|---|
| 2018 | 8.8 | 16.3 | 20.2 | 32.6 |
| 2019 | 12.8 | 15.7 | 22.5 | 30.7 |

**මූලාශ්‍රයඃ ශ්‍රම බල සමීක්ෂණ වාර්ථාව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2011-2019)**

ඉහත සංඛ්‍යා සටහන අනුව ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය නතර කරන තරුණ ප්‍රජාව අතර පවතින විරැකියාවේ ස්වභාවය හඳුනා ගත හැකිය. එහි දී අඩු විරැකියා අනුපාතයක් පෙන්නුම් කරන්නේ 5 ශ්‍රේණිය සමත් ඉන් පහළ අධ්‍යාපනයක් සහිත ප්‍රජාව අතරයි. ඉහලම විරැකියා අනුපාතයක් පවතින්නේ අ.පො.ස උසස් පෙළ හා ඊට ඉහල අධ්‍යාපන සුදුසුකම් පවතින තරුණ ප්‍රජාව අතර වීම සුවිශේෂී කරුණකි.

## සාහිත්‍ය විමර්ශනය

Torild and Axel (2009) කෙටිකාලීන විරැකියාව කෙරෙහි බලපාන අධ්‍යාපනය, පුමුතිරිභාවය හා පවුලේ ආර්ථික මට්ටම් පිළිබඳව සංසන්දනාත්මකව අධ්‍යයනය කොට තිබේ.එහිදී අධ්‍යාපන පුමිතිරිභාවය හා පවුලේ ආර්ථික මට්ටම න්‍යායාත්මකව කෙටිකාලීන විරැකියා තත්ත්වයට බලපානවා ද යන්න පරීක්ෂා කරන අතර එහිදී විරැකියාව හා අධ්‍යාපන මට්ටම,විරැකියාව හා පුමිතිරිභාවය, විරැකියාව හා පවුලේ ආර්ථික මට්ටම අතර සම්බන්ධතාවය විමර්ශනාත්මකව අධ්‍යයනය කරයි. ඒ සඳහා යුරෝපීය රටවල් කිහිපයක් යොදාගෙන ඇති අතර යුරෝපීය සමාජ සමීක්ෂණය (Europen Social Survery2008/09) මගින් රටවල් දහයක් දත්ත ලබාගෙන සිදු කර ඇත.අඩුතම වර්ග ක්‍රමය යොදාගෙන ඇති පර්යේෂණ ක්‍රමවේදයයි. ස්වායක්ත විචල්‍යයන් ලෙස අධ්‍යාපනය, වයස, පුරවැසිභාවය, ආදායම් ආදී ද යොදා ගෙන ඇත. මෙහිදී කෙටිකාලීන විරැකියාව කෙරෙහි අධ්‍යාපන මට්ටම පුමිතිරිභාවය කෙටි කාලීන විරැකියාවට සෘජු බලපෑමක් ඇතිකරන බවත්, පවුලේ ආර්ථික මට්ටමට එය සෘජු බලපෑමක් ඇති නොකරන බවත් අධ්‍යනයෙන් හෙළිවී ඇත.

ඉන්දියාවේ ප්‍රාන්ත කිහිපයක් හිමබෝල නියදුම් ක්‍රමය අනුව තෝරාගෙන, Nyaulu (2011) විසින් සිදුකරන ලද අධ්‍යයනයකදී අඩු පහසුකම් සහිත ප්‍රදේශ වල සේවා වියුක්තිය කෙරෙහි බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කර ඇත. එහිදී මූලික අරමුණ වී ඇත්තේ අඩු පහසුකම් සහිත ප්‍රදේශ වලඋසස් අධ්‍යාපනයෙන් පසුව ඔහුගේ රැකියා වරණය කුමක් ද යන්න අධ්‍යයනය කිරීමයි. මෙහිදී පර්යේෂකයා හඳුනාගෙන ඇත්තේ අඩු නිපුනණතාවක් සහ අඩු අධ්‍යාපන මට්ටමක් හේතුවෙන් විරැකියාවෙන් පෙළෙන ප්‍රතිශතය වඩා ඉහළ බවයි. තවද අඩු පහසුකම් සහිත ප්‍රදේශවල විරැකියා තත්ත්වය සෙසු ප්‍රදේශවලට සාපේක්ෂව ඉහළබවයි. මෙහිදී විරැකියාවෙන් පෙළෙන බොහෝ දෙනා ජාතික ආර්ථිකයට යොමු කරගැනීමට අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම, යටිතල පහසුකම් දියුණු කිරීම යනාදිය ශක්තිමත් කළ යුතු බව පෙන්වා දෙයි.

ගුණතිලක(2017) විශ්වවිද්‍යාල සිසුන්ගේ විරැකියා තත්ත්වය කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කර ඇත. එහිදී විශ්වවිද්‍යාල හතක් තෝරාගෙන ඇති අතර ඉන් විවිධ අංශ නියෝජනය වන ලෙස අධ්‍යාපනය අවසන් කරන ලද ශිෂ්‍ය නියැදියක් තෝරා ගෙන ඒ සඳහා ලබාදුන් ප්‍රශ්ණාවලියක් මගින් දත්ත රැස් කොට ගෙන ඇත. මෙලෙස ලබාගත් දත්ත අනුව ඔවුන්ගේ වර්තමාන රැකියා තත්වය අධ්‍යයනය කොට ඇති අතර එයින් 57% වැඩි පිරිසක් විරැකියාවෙන් පෙළෙන බව අනාවරණය වී ඇත. එහිදී ගැළපෙන රැකියාවක් නොමැති වීම හා රැකියා වරණය හේතු සාධක කොටගෙන රජයේ රැකියාවක් බලාපොරොත්තුවෙන් නිවසේ සිටින ප්‍රමාණය ඉහළ බව අනාවරණය වී ඇත. මෙහිදී පර්යේෂකයන් පෙන්වා දෙන්නේ අධ්‍යාපන ක්‍රමවේදය හා ශ්‍රම වෙළඳපොළ නොගැළපීම මත මෙලෙස උසස් අධ්‍යාපනය ලැබවූවන් අතර විරැකියාවේ තත්ත්වය ඉතා ඉහළ බවයි.

## අධ්‍යයන ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය අනුපාතය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඉහළම අගය වාර්තා වන්නේ මාතර (2020) දිස්ත්‍රික්කයේය. එම අගය 8.6% කි.ඉහළ අධ්‍යාපනික පසුබිමක් පැවතීම, අධ්‍යනයේ පහසුව,ජනවර්ග කිහිපයක් මාතර දිස්ත්‍රික්කය තුළ ජීවත් වීම, විධිමත් අධ්‍යාපන ආයතන කිහිපයක් පැවතීම යන කරුණු පදනම් කොටගෙන මාතර දිස්ත්‍රික්කය අධ්‍යයනය සඳහා තෝරා ගැනීම වඩාත් යෝග්‍ය විය.මෙහිදී මාතර දිස්ත්‍රික්කයේ මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ග්‍රාම නිලධාරී වසම් හතරක් ආශ්‍රයෙන් සේවා වියුක්ත පුද්ගලයන් 92ක නියදිය සඳහා යොදා ගන්නා ලදී. මෙහිදී ප්‍රශ්න මාලා සහ සම්මුඛ සාකච්ඡා හරහා ප්‍රාථමික දත්ත රැස් කරන ලදි. පූර්ව පරීක්ෂණ වාර්තා,ප්‍රාකාශිත වාර ප්‍රකාශන, සඟරා ලිපි, මගින් ද්විතීක දත්ත රැස් කරන ලදි.ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී පොකුරු නියදුම් ක්‍රමය යොදා ගන්නා ලදී. මෙම ප්‍රාථමික දත්ත,විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, කයිවර්ග පරීක්ෂාව, සහසම්බන්ධතා සංගුණකය සහ සාධක විශ්ලේෂණය ආදී ක්‍රමවේදයන් ඔස්සේ විශ්ලේෂණය කරයි.

## අධ්‍යයන ප්‍රදේශය

අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීමේදී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක මට්ටමෙන් විරැකියා අනුපාතයට අදාළදත්ත ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව අධ්‍යයනය තුළින් සිදු කරන ලදී. 2020 ශ්‍රම බල සමීක්ෂණ වාර්තාවට අනුව ඉහළ විරැකියා අනුපාතයක්සහිත දිස්ත්‍රික්ක පහත වගුව මගින් දක්වා ඇත.

**වගු අංක 04: සේවා වියුක්තිය ඉහළ අගයක් ගන්නා දිස්ත්‍රික්ක**

| **දිස්ත්‍රික්කය** | **සේවා වියුක්ති ප්‍රතිශතය** |
|---|---|
| මාතර | 8.6 |
| හම්බන්තොට | 7.9 |
| නුවර | 7.5 |
| ගාල්ල | 7.0 |

**මූලාශ්‍රයඃ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2020)**

ශ්‍රී ලංකාවේ ඉහළ සේවා වියුක්ති අගයක් මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක වලින් වාර්තා වෙයි. ඒ අනුව ඉහලම අගය වාර්තා කරන මාතර දිස්ත්‍රික්කය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගන්නා ලදී. මෙහි මාලිම්බඩ ප්‍රදේශීය ලේකම් කාර්‍යාලය නියැදිය සඳහා යොදා ගැනුණි.

## නියදිය තෝරා ගැනීම

තෝරා ගන්නා ලද සංගහනය තුළින් පරීක්ෂණයට භාජනය කරන නියදියක් තෝරා ගන්නා ලදී.මෙහිදී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම් හා සේවා වියුක්ති උපනතීන් කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය සඳහා නියදිය තෝරා ගන්නා ලදී. මෙහි දී සසම්භාවී නියදුම් ක්‍රමය ඒ සඳහා යොදා ගෙන ඇත. එහිදී නියදි ඒකක තේරීම සම්භාවිතා පදනමක් මත සිදුවේ. මෙම අධ්‍යයනයේ දී සසම්භාවී නියදුම් ක්‍රම භාවිතයෙන් නියැදිය තෝරා ගැනීමේදී නියදියටප්‍රවේශවීමේ සමාන අවස්ථාව (1/nCN) ආරක්ෂා වේ. එහිදී පුද්ගල බද්ධ තීරණ නියදියට බලපෑමක් ඇති නොකරයි. පොකුරු නියදීම තුළ නියදිය තෝරා ගන්නා ලදී.

### වගු අංක 05 තෝරාගත් නියදිප්‍රදේශ තුළ ජනගහනය

| **ග්‍රාම නිළධාරී වසම** | **මුළු ජනගහනය** |
| --- | --- |
| කිරිමැටිමුල්ල දකුණ | 1686 |
| මාලිම්බඩ බටහිර | 1506 |
| මාලිම්බඩදකුණ | 949 |
| හොරගොඩ නැගෙනහිර | 1966 |
| **එකතුව** | **6097** |

**මූලාශ්‍රයඃ සම්පත් පැතිකඩ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වාර්තා 2020**

සංගහනයේ කිරිමැටිමුල්ල දකුණ, මාලිම්බඩ බටහිර, මාලිම්බඩ දකුණ, හොරගොඩ නැගෙනහිර යන ග්‍රාම නිලධාරී වසම් වල සේවා වියුක්ත පිරිස 2904 ක් වන අතර යාමනී ක්‍රමය අනුව 92 නියැදියක් තෝරා ගන්නා ලදී.

### නියැදිය තෝරා ගැනීම

| **ග්‍රාම නිළධාරී වසම** | **නියදි ඒකක සංඛ්‍යාව** |
| --- | --- |
| කිරිමැටිමුල්ල දකුණ | 26 |
| මාලිම්බඩ බටහිර | 23 |
| මාලිම්බඩදකුණ | 15 |
| හොරගොඩ නැගෙනහිර | 28 |
| **එකතුව** | **92** |


**මූලාශ්‍රය නියැදි දත්ත (2022)**

### දත්ත විශ්ලේෂණය

**සේවා වියුක්ති ජගහනය අධ්‍යාපනය ලැබූ ආකාරය**

ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ජනගහනය අධ්‍යාපනය ලබා ඇති ආකාරය කෙසේදැයි විමසා බැලිය හැක.

**ප්‍රස්තාර සටහන 01ඃ සේවා වියුක්ති ජනගහනය අධ්‍යාපනය ලැබූ ආකාරය**




**මූලාශ්‍රයඃ නියැදි දත්ත 2022**

ප්‍රස්තාර සටහනට අනුව සේවා වියුක්ති ජනගහනයෙන් විධිමත් අධ්‍යාපනය ලැබූ ප්‍රතිශතය 73.3% කි. මෙම තත්වය මෙම ප්‍රදේශයට පමණක් ආවේණික වූවක් නොව සමස්ත ශ්‍රී ලංකාවේම තත්ත්වයයි. සේවා වියුක්ති ජනගහනයෙන් නොවිධිමත් අධ්‍යාපනය ලැබූ ප්‍රතිශතය 17.67% ක් වන අතර අවිධිමත් අධ්‍යාපනය ලැබූ ප්‍රතිශතය 9%කි. මෙහිදී විධිමත් අධ්‍යාපනය ලැබූ පිරිස රැකියා වරණය කරන අතර නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපනය ලැබූවන් සිය පළමු අවස්ථාව රැකියාව ලෙස බාර ගැනීමක් හඳුනා ගත හැකිය. මෙමගින් ගම්‍යවන්නේ සේවා වියුක්ති ජනගහනයේ අධ්‍යාපන මට්ටම ඉහළ අගයක් ගන්නා බවයි. ඒ සඳහා ප්‍රදේශයේ පාසල්, විශ්වවිද්‍යාල,ද්විතීක අධ්‍යාපනය ආයතනය හා යටිතල පහසුකම් බලපා ඇත.

විධිමත් අධ්‍යාපනයක් ලැබීම කෙරෙහි,සේවා වියුක්තියට හා රැකියා වරණය අතර ස්වායක්තතාව පරික්ෂා කිරීමේදී ($x^2$ =46.135, P=0.000) එම විචල්‍ය අතර සම්බන්ධතාවක්පවතින බව පෙන්නුම් කර ඇත.විධිමත් අධ්‍යාපනයක් ලැබීම කෙරෙහි, සේවා වියුක්තියට හාප්‍රදේශයේ රැකියා අවස්ථා පැවැතීම අතර ස්වායත්තතාව පරික්ෂා කිරීමේදී($x^2$ =13.438, P=0.338) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත.විධිමත් අධ්‍යාපනයක් ලැබීම කෙරෙහි, සේවා වියුක්තියටහා පවුලේ ආදායම් මට්ටම අතර ස්වායක්තතාව පරික්ෂා කිරීමේදී ($x^2$ = 6.862, P=0.552) එම විචල්‍ය අතර සම්බන්ධතාවක් නොපවතින බව පෙන්නුම් කර ඇත.

අවිධිමත් අංශයේ අධ්‍යාපනයලැබීම කෙරෙහි,සේවා වියුක්තිය හා රැකියාවරණය අතර ස්වායක්තතාව පරික්ෂා කිරීමේදී ($x^2$ = 4.831, P=0.305)එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත.අවිධිමත් අංශයේ අධ්‍යාපනයලැබීම කෙරෙහි,සේවා වියුක්තිය හා ප්‍රදේශයේ රැකියා අවස්ථා පැවතීම අතර ස්වායක්තතාව පරික්ෂා කිරීමේදී ($x^2$ = 16.436, P=0.172) එම විචල්‍යඅතර සම්බන්ධතාවයක් නොපවතින බව පෙන්නුම් කර ඇත.අවිධිමත් අංශයේ අධ්‍යාපනයලැබීම කෙරෙහි, සේවා වියුක්තියහා පවුලේ ආදායම් මට්ටම අතර ස්වායක්තතාව පරික්ෂා කිරීමේදී ($x^2$ = 30.587, P=0.001) එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් පවතින බව පෙන්නුම් කර ඇත.

නොවිධිමත් අංශයේ අධ්‍යාපනය ලැබීම කෙරෙහි,සේවා වියුක්තිය හා රැකියා වරණය අතර ස්වායක්තතාව පරික්ෂා කිරීමේදී ($x^2$ = 1.295, P=0.935) එම විචල්‍ය අතර සම්බන්ධතාවක්

නොපවතින බව පෙන්නුම් කරයි.නොවිධිමත් අංශයේ අධ්‍යාපනය ලැබීම කෙරෙහි, සේවා වියුක්තිය හා ප්‍රදේශයේ රැකියා අවස්ථා පැවතීම අතර ස්වායක්තතාව පරික්ෂා කිරීමේදී ($x^2$ = 16.221, P=0.703)එමවිචල්‍ය අතර සම්බන්ධතාවක් නොපවතින බව පෙන්නුම් කර ඇත.නොවිධිමත් අංශයේ අධ්‍යාපනය ලැබීම කෙරෙහි,සේවා වියුක්තිය හා පවුලේ ආදායම් මට්ටම අතර ස්වායක්තතාව පරීක්ෂා කිරීමේදී ($x^2$ = 5.357, P=0.719) මෙම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව බව පෙන්නුම් කර ඇත.

**සමාලෝචනය**

**නිගමනය**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන නිගමනය වන්නේ විරැකියා තත්ත්වය කෙරෙහි විධිමත් අධ්‍යාපනය ලබා තිබීම හා රැකියා වරණය අතර ධන සම්බන්ධතාවයක් පවතින බවයි. මෙහිදී විධිමත් අධ්‍යාපනය පාසල් හා උසස් අධ්‍යාපන ආයතන හරහා ලබා ගනී. එවිට ඔවුන් බොහෝවිට කාර්යාලීය වටපිටාවක් වැඩකටයුතු කිරීමට කැමැත්තක් දක්වයි. ලිපි ලේඛන ආශ්‍රිත රැකියා සඳහා ඉන් වැඩි නැඹුරුවක් පවතින අතර නිෂ්පාදන අංශයේ රැකියා වරණයක් විධිමත් අධ්‍යාපනය ලැබූවන් තුළින් හඳුනාගත හැකිය. ලිපි ලේඛන ආශ්‍රිත රැකියා බොහෝවිට සුබසාධන කාර්යයන් හා රාජ්‍ය අංශය හා බැඳී පවතී. මෙම රැකියා අවස්ථා සඳහා අවස්ථාව සැලසෙන්නේ ඉතා සීමිත පිරිසක් සඳහා පමණි. එවිට එවැනි අවස්ථාවක් ලැබෙන තෙක් විධිමත් අධ්‍යාපනය ලැබූවන් රැකියා වරණය කිරීම තුළ ඔවුන් වැඩි කාලයක් විරැකියා තත්ත්වයෙන් ආර්ථිකයේ රැඳී සිටියි. ඒ සඳහා ප්‍රධාන බලපෑම වී ඇත්තේ අධ්‍යාපන රටාව තුළ ගොඩනැගෙන ආකල්ප හා විධිමත් අධ්‍යාපනය තුළ ලබාදෙන දැනුම වැඩ ලෝකය හා නොගැලපීමයි. විරැකියා තත්ත්වය කෙරෙහි අවිධිමත් අංශයේ අධ්‍යාපනය ලබා තිබීම හා රැකියා වරණය අතර සම්බන්ධතාවක් නොපවතී. එනම් අවිධිමත් අංශය තුළින් අධ්‍යාපනය ලැබූවන් තමාට ලැබෙන පළමු රැකියා අවස්ථාව සඳහා ම යොමු වේ.එනම් ඔවුන් තුළ වැඩ ලෝකයේ නිෂ්පාදන අංශයට අවශ්‍ය දැනුම ලබා තිබීම හේතුවෙනි.

එසේම විරැකියා තත්ත්වය කෙරෙහි අවිධිමත් අංශයේ අධ්‍යාපනය ලබා තිබීම හා රැකියා වරණය අතර සම්බන්ධතාවයක් නොපවතී. වැඩ ලෝකය සඳහාම වූ දැනුම ලබා දෙනක්‍රමවේදයක් හේතුවෙන් රැකියා වරණයට ඔවුන්ට අවස්ථාව නොලැබෙන අතර ඔවුන් තම අධ්‍යාපනය ලබන ක්ෂේත්‍රයේමරැකියාගත වේ.

ඉහත කරුණු අනුව ගම්‍ය වන්නේ ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළෙහි අර්බුදයක් පවතින බවයි. එනම් ශ්‍රම ඉල්ලුම් හා ශ්‍රම සැපයුම තුළ විෂමතාවක් පවතින බවයි. ශ්‍රම වෙළඳපොළ තුළ . ශ්‍රම ඉල්ලුමක් පැවතිය ද ඊට සරිලන තාක්ෂණික දැනුම සහිත ශ්‍රම සැපයුමක් නොමැත. එසේම තවත් සමහර අංශ වල ඉහල ශ්‍රම සැපයුමක් පැවතිය ද එය අවශෝෂණය කර ගැනීමට ශ්‍රම වෙළඳපොළ අසමත්ව ඇත. තව ද සමාජය තුළ සාම්ප්‍රදායික රාමුව හේතුවෙන් කාන්තාව ගෘහ කටයුතු සඳහාම යෙදවීම තුළ තරුණ ස්ත්‍රී විරැකියා අනුපාතය ඉහළ අගයක් ගෙන ඇත. බහුතර යැපුම් ජනගහනයක්ම රැක බලා ගැනීමේ වගකීම කාන්තාවන්ට පැවරී තිබීම ස්ත්‍රී විරුකියා අනුපාතය ඉහළ යන්නට හේතු සාධක වී ඇත. ශ්‍රම වෙළඳපොළ තුළ හටගෙන ඇති මෙම විෂමතාවය අවම කිරීම සඳහා යොදගත හැකි පිළියම් කිහිපයක් හඳුනා ගත හැකිය. එනම් රැකියා වෙළඳපොළට ගැළපෙන පරිදි ශ්‍රම සැපයුම (ශ්‍රම බලකාය) හැඩගැස්විය යුතුය. ඒ තුළ ක්‍රියාත්මක වන විධිමත් අධ්‍යාපනය තුළින් ශ්‍රම විශේෂීකරණය හඳුනාගෙන ඊට ගැලපෙන වෘත්තීය මාර්ගෝපදේශ ලබා දීම, වැඩි ශ්‍රම ඉල්ලුමක් පවතින ක්ෂේත්‍ර හඳුනාගෙන පාසල් අධ්‍යාපනයෙන් අනතුරුව දරුවන් ඊට යොමු කිරීම, ඊට අවශ්‍ය ක්‍රමවත් හා විධිමත් වූ වෘත්තිය පුහුණුව දරුවන්ට පාසල් කාලය තුළම හෝ ඉන් අනතුරුව ලබා දීම, උදහරණ ලෙස දරුවන් අ.පො.ස සාමාන්‍ය පෙළ අසමත් වීම හෝ පෙනී නොසිටි

විට ඔවුන් කැමති අංශ තෝරා වසරක හෝ වසර දෙකක කාලයක් සවස් වරු තුළ පාසල් පද්ධතිය තුළ වෘත්තීය අධ්‍යාපනය ලබා දීම. මෙම ක්‍රියාදමය සාර්ථක කිරීමට නම් දරුවන්ගේ ආකල්ප සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය සාධකයකි. නිදහස් ශ්‍රම සංචලනයකට අවශ්‍ය වෙළඳපොළ බලවේග සකස් කළ යුතුය. ශ්‍රම සූක්‍ෂම නිෂ්පාදන කර්මාන්ත ආරම්භයට අවශ්‍ය පහසුකම් ලබා දීම, නිෂ්පාදන අංශයට අවශ්‍ය වෙළඳපොළ ජාලය ක්‍රමවත් කිරීම, අයෝජන ප්‍රවර්ධනය කිරීම හා ඊට අදල ප්‍රාග්ධන සම්පාදනයට ප්‍රතිපාදන ලබා දීම, තවද ජාත්‍යන්තර වෙළඳ ජාලයට සම්බන්ධ වීමට අවශ්‍ය ප්‍රතිපත්ති හා පහසුකම් විධිමත් කිරීම තුළ මෙම විෂමතාවය අවම කර ගත හැකිවනු ඇත.

**යෝජනා**

විධිමත් අධ්‍යාපනය ලැබූ පිරිස අතර ඉහළවිරැකියාවක් පවතිනුයේ එම අධ්‍යාපනය ශ්‍රම වෙළඳ පොළට නොගැලපීමයි. ඒ අනුව ශ්‍රම වෙළඳ පොළට ගැළපෙන ලෙස විධිමත් අධ්‍යාපනික රාමුව වෙනස් විය යුතුය. එය නිෂ්පාදන ආර්ථිකය මූලික කොටගෙන සිදු විය යුතුය.නිෂ්පාදන ආර්ථිකයට අදාළ දැනුම විධිමත් ක්‍රමවේදයක් තුළ ලබා දීමෙන් ශ්‍රම බලකාය ශක්තිමත් කර ගත හැකිය. අවිධිමත් හා නොවිධිමත් මාධ්‍ය වලින් ලබා දෙන දැනුම සඳහා නිසි ප්‍රමිතියක් හා ගුණාත්මක ක්‍රමවේදයක් බිහි කිරීම ශ්‍රමබලකාය තවත් ශක්තිමත් කළ හැකිය.

වෙළෙඳ පොළ අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස අධ්‍යාපන රටාව වෙනස් විය යුතු අතර එහිදී ද්විතීක හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍ර වලදී ඒවා කාලීනව වෙනස් විය යුතුය. එවිට ශ්‍රම වෙළෙඳපොළ සේවා වියුක්ති ජනගහනය අවම වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අතපත්තු ඩැනී,(2011) ආර්ථික විද්‍යා ප්‍රවේශය 02, කතෘ ප්‍රකාශන.

ආරච්චි, එම්.කේ. (2009), "අධ්‍යාපන සංවාද" , අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය,කොළඹ.

කාරියවසම්. සී(1999) ලෝක අධ්‍යාපන ප්‍රවනතා, කොළඹ 08, ශික්‍ෂා මන්දිර ප්‍රකාශන.

ගුණතිලක. කේ. (2017). විශ්ව විද්‍යාල සිසුන්ගේ විරැකියාව කෙරෙහි බලපාන සාධක. ආර්ථික විද්‍යා පර්යේෂණ ලිපි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

ගුණසේකර. එස් (2011) අපේ අධ්‍යාපනයේ සබෑ මුහුණුවර, නුගේගොඩ, සුනෙර ප්‍රකාශන.

බන්ඩාර, පී, එම්, එන්, (1987)ශ්‍රී ලංකා ආර්ථිකයේ මෑත කාලීන ප්‍රවනතා, කොළඹ, ඇස් ගොඩගේ සහෝදරයෝ.

ශ්‍රම බල සමීක්‍ෂණ වාර්ථා (2010 සිට 2019 දක්වා) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය.

හේරත්, ටී.එන් (2009) අධ්‍යාපන ප්‍රතිපත්ති හා පරිපාලනය, කොළඹ. 10. එස් ගොඩගේ සහ සහොදරයෝ.

Cencini, A. (2005). *Macroeconomics Foundation*. London: Routledge.

Central Bank of Sri Lanka. (2019).*Economic and social statistics of Sri Lanka*. Colombo: Central Bank of Sri Lanka.

Department of Census and Statistics of Sri lanka. (2010-2019).*Labourforce survey - Annual report*. Colombo: Department ofCensus and Statistics.

Nanayakkara. A. G. W. (2004). *Employment and unemployment in Sri Lanka – trends, issues and options*.Colombo: Departmentof Census and Statistics

Nyasulu M.N.(2011). *Factors affecting unemployment in India*.Journal of Social economy 76p III-232

Torild Hommer and Axel west pedesrsen (2009).*Factors affecting Short – term unemployment*.Journal of Human Resources (2) 282-307